සියලුම හිමිකම් ඇවිරිණි / All Right Reserved

සාමාන්‍ය තොරතුරු තාක්ෂණ විභාගය, 2019, 2020, 2021, 2022(2023)
General Information Technology Examination, 2019, 2020, 2021, 2022(2023)

සාමාන්‍ය තොරතුරු තාක්ෂණය I, II
General Information Technology I, II

GIT | S | I, II

පැය තුනයි
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
Additional Reading Time -10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න

සාමාන්‍ය තොරතුරු තාක්ෂණය I

1. දශමය 65, ද්විමය වශයෙන් නිරූපණය කිරීමට බිටු පිහිටුම්......... ක් අවශ්‍ය වේ. ඉහත ප්‍රකාශයේ හිස්තැන් පිරවීම සඳහා වඩාත් සුදුසු සංඛ්‍යාව කුමක්ද?
   1) 8 2) 7 3) 6 4) 5

2. සමාගමකට සේවාදායකයෙකු සමග මාර්ගගත ක්‍රමයට ගිවිසුමක් අත්සන් කිරීමට අවශ්‍යව ඇත. මෙම ගිවිසුමෙහි පිරිසැලසුම කිසිවෙකුට වෙනස් කළ නොහැකි වන සේ සකස් කිරීමට වඩාත්ම සුදුසු ගොනු ප්‍රරූපය කුමක්ද?
   1) ODT 2) PDF 3) DOC 4) HTML

2. පහත සඳහන් කවරක් වදන් සැකසුම් මෘදුකාංගයක් භාවිතයෙන් කළ හැකි දේ වඩාත් හොඳින් විස්තර කරයි ද?
   1) ලේඛනයක් යතුරු ලියනය කිරීම
   2) ලේඛනයක් යතුරු ලියනය කිරීම සහ මුද්‍රණය කිරීම
   3) ලේඛනයක් යතුරු ලියනය කිරීම, හැඩසවි ගැන්වීම (formatting) සහ සුරැකීම (saving)
   4) ලේඛනයක් යතුරු ලියනය කිරීම, හැඩසවි ගැන්වීම , සුරැකීම සහ මුද්‍රණය කිරීම

3. පහත සඳහන් කුමක් නිදහස් පැතුරුම්පත් මෘදුකාංගවල නම් පමණක් නිරූපණය කරයිද?
   1) Apple Numbers, Google Sheets, LibreOffice Calc
   2) Apple Numbers, LibreOffice Calc, Microsoft Excel
   3) Google Sheets, LibreOffice Calc, OpenOffice Calc
   4) LibreOffice Calc, Microsoft Excel, OpenOffice Calc

4. පැතුරුම්පතක ඇති කෝෂයකට = 3 / 6 * ( 5 + 4 ) / 3 - 7 යන සූත්‍රය ඇතුළත් කර ඇතිවිට, එම කෝෂයේ දැක්වෙන අවසාන අගය වන්නේ පහත සඳහන් කවරක්ද?
   1) -5.5 2) -3.7 3) -0.25 4) 2.5

5. සමාගමක අලෙවි කළමනාකරුවෙකුට නව නිෂ්පාදනයක් එළිදැක්වීම පිළිබඳ තොරතුරු එහි අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කිරීමට අවශ්‍යව ඇත. මෙම කාර්යය සඳහා වඩාත් යෝග්‍ය වන්නේ පහත සඳහන් කුමන මෘදුකාංගය ද?
   1) පැතුරුම්පත් මෘදුකාංගය
   2) වදන් සැකසුම් මෘදුකාංගය
   3) සමර්පන මෘදුකාංගය
   4) දත්ත සමුදා මෘදුකාංගය

6. පහත සඳහන් කුමන අංගය, සමර්පණයක දී කදාවක් සෙමින් ප්‍රදර්ශනය කිරීමට භාවිතා කරයි ද?
   1) සජීවිකරණය (Animation)
   2) සංක්‍රමණ (Transition)
   3) තේමාව (Theme)
   4) ගුරු කදාව (Slide Master)

7. දත්ත සමුදාය කළමනාකරණ පද්ධතියක් (DBMS) අවශ්‍ය වන්නේ පහත දැක්වෙන කවර යෙදුමට ද?
    1) වෙබ් අඩවියක නරඹන්න ගණන වාර්තා කිරීම
    2) පුද්ගලයකුගේ ඇඟිලි සලකුණක් හඳුනාගැනීම
    3) වායුසමන යන්ත්‍රයක් ස්වයංක්‍රීයව පාලනය කිරීම
    4) මිනිස් මුහුණක් හඳුනාගැනීම

8. පහත සඳහන් කුමක්, ඩිජිටල් රූපයක ගුණාංග නිවැරදි ව විස්තර කරයි ද?
    1) රේඛා පුංජ ආලේඛ (Raster)
    2) දෛශික (Vector)
    3) විභේදනය (Resolution)
    4) ස්තර (Layers)

9. පහත සඳහන් දෑ අතුරින් පෙළ ප්‍රයෝග (text effects) බහුලව භාවිතාවන ග්‍රැෆික් නිර්මාණ ප්‍රරූපය කුමක්ද?
    1) කලා (Art) නිර්මාණය
    2) හැඩතල (Shapes) නිර්මාණය
    3) රූප (Image) නිර්මාණය
    4) වෙබ් (Web) නිර්මාණය

10. වෙබ් අඩවියක් සතුව 'වලංගු අංකිත සහතිකයක්' ඇත්දැයි ඔබ හඳුනාගන්නේ කෙසේද?
    1) ලිපින තීරුවේ ඇති ඉබි අගුල සලකුණ සාමාන්‍ය ලෙස පවතී
    2) ලිපින තීරුවේ ඇති තරු සලකුණ වර්ණවත් ව ඇත.
    3) ලිපිනය 'WWW' යනුවෙන් ආරම්භ වේ.
    4) එය වෙළඳ දැන්වීම්වලින් තොර ය.

11. වෙබ් පිටුවක් සම්බන්ධයෙන් පහත සඳහන් කුමන ප්‍රකාශය නිවැරදි ද?
    1) වෙබ් පිටුවක් යනු ලෝක ව්‍යාප්ත වෙබ් අඩවියේ ඇති පෙළ (text) පමණක් සහිත ලේඛනයකි.
    2) MS Word ලේඛනයක් වෙබ් පිටුවක් ලෙස සුරැකිය හැකිය.
    3) වෙබ් අඩවිය සහ වෙබ් පිටුව යන දෙකම එකකි.
    4) වෙබ් පිටුවකට අනන්‍ය වසම් නාමයක් ඇත.

12. අධිසන්ධානයක් (hyperlink) නිවැරදිව විස්තර කරන්නේ පහත සඳහන් කුමන ප්‍රකාශයෙන් ද?
    1) රූපයකට තිබිය හැක්කේ එක් අධිසන්ධානයක් පමණි.
    2) වෙබ් පිටුවක ඇති අධිසන්ධානයක් සෑම විටම බාහිර වෙබ් පිටුවකට සම්බන්ධ වේ.
    3) QR කේත කඩදාසි මත පදනම් වූ අධිසන්ධානයක් ලෙස සැලකේ.
    4) අධිසන්ධානයක් සැමවිටම දත්ත සමුදා සේවාදායක වෙත යොමු කරයි.

13. පහත ඒවායින් සෙවුම් යන්ත්‍රයක් වන්නේ කුමක්ද?
    1) Microsoft Edge
    2) Google Chrome
    3) Mozilla Firefox
    4) Microsoft Bing

14. MOOCs වලට අදාළ පහත සඳහන් දේවලින් සත්‍ය කුමක්ද?
    1) MOOCs මගින් හැඳින්වෙන්නේ Massive, Online, Open source, Courses යන්නය.
    2) සියලුම MOOCs පාඨමාලා නොමිලේ ලබා ගත හැක.
    3) MOOCs පාඨමාලාවක් හැදෑරීමට, සම්පූර්ණ කළ යුතු පූර්වාවශ්‍යතා තිබේ.
    4) මිනිසුන්ට MOOCs පාඨමාලාවල සහයෝගයෙන් වැඩ කළ නොහැකිය.

15. පහත සංසිද්ධිය සලකා බලන්න.
ඔබ ඔබේ මිතුරන් සමඟ නිවසට නුදුරු අවන්හලක රාත්‍රී ආහාරය ගත් බව සිතන්න. රාත්‍රී ආහාරය ගැනීමෙන් පසු, ඔබ වෙත පැමිණෙන වේටර්වරයා ඔබ ඇණවුම් කළ එක් එක් ආහාර ද්‍රව්‍ය වල මිල ගණන් සහ මුළු මුදල සමග සවිස්තරාත්මක බිල්පත ලබා දුන්නේ ය. ඔබ අවන්හලෙන් පිටවීමට පෙර සවිස්තරාත්මක බිල්පත පරීක්ෂා කර ගෙවීම සිදු කළේය.
ඉහත සිදුවීමට අදාළව දත්ත සහ තොරතුරු නිවැරදිව විස්තර කිරීමට වඩාත් යෝග්‍ය වන්නේ පහත සඳහන් කුමන ප්‍රකාශය ද?
1) බිල්පතේ මුළු මුදල තොරතුරක් පමණක් වන නමුත් එය දත්තයක් නොවේ.
2) බිල්පතේ මුළු මුදල දත්තයක් පමණක් වන නමුත් එය තොරතුරක් නොවේ.
3) මුළු මුදල සවිස්තරාත්මක බිල්පත ලැබුණු විට තොරතුරක් වූ නමුත් මුදල් ගෙවන අවස්ථාවේදී එය දත්තයක් බවට පත් විය.
4) සපයා ඇති විස්තර අනුව සවිස්තරාත්මක බිල්පත දත්තයක් ද තොරතුරක් ද යන්න තීරණය කිරීමට නොහැකිය.

16. ASCII හා Unicode සම්බන්ධයෙන් පහත සඳහන් කුමන ප්‍රකාශය සත්‍ය ද?
1) ASCII හි ඇති අක්ෂර ගණන Unicode වලට වඩා වැඩිය.
2) Unicode වල ගැටලු මග හරවා ගැනීම සඳහා ASCII සංවර්ධනය කරන ලදී
3) Unicode බහුභාෂා පරිගණනයට සහාය වන නමුත් ASCII ඉංග්‍රීසි භාෂාවට පමණක් සීමා වේ.
4) Unicode හා ASCII එක් එක් අක්ෂරය නියෝජනය කිරීමට බයිට් 4 ක් භාවිතා කරයි.

17. වදන් සැකසුමක ලේඛනයක ඇති හිස් වගුවක දී 'Alt' සහ 'Down Arrow' යන යතුරු එකවර එබූ විට සිදුවන්නේ කුමක්ද?
1) නව තීරුවක් ඇතුල් වෙයි.
2) නව පේළියක් ඇතුල් වෙයි.
3) සැරිය (Cursor) ඊළඟ තීරුවට වෙත ගමන් කරයි.
4) සැරිය ඊළඟ පේළියට ගමන් කරයි.

18. ඔබට E1, E2 සහ E3 කෝෂවල පිළිවෙලින් 1,2 සහ 3 අගයන් සහිත පැතුරුම්පතක් ලබා දී ඇත. F1 කෝෂයේ = $E1 + E2 + $E$3 සූත්‍රය ඇත.
F1 හි ඇති සූත්‍රය F2 වෙත පිටපත් කළ විට දී F2 හි අගය ලබා දෙන්නේ පහත සඳහන් ඒවායින් කුමක්ද?
1) 6 2) 7 3) 8 4) 9

19. විවිධ බලශක්ති ප්‍රභවයන්ගේ වාසි සහ අවාසි පිළිබඳ සමර්පණයක් සකස් කිරීම සඳහා විද්‍යා ගුරුවරයෙකු කණ්ඩායම් පැවරුමක් ලබා දී ඇත. මේ සඳහා MS PowerpPoint හි සුදුසු පිරිසැලසුමක් (Layout) ෂමිත් හා ඔහුගේ කණ්ඩායම සොයමින් සිටිති.
මේ සඳහා වඩාත් සුදුසු පිරිසැලසුම වන්නේ පහත සඳහන් කුමක්ද?
1) හිස් කදාව (Blank Slide)
2) සැසඳීම (Comparison)
3) මාතෘකාව සහ අන්තර්ගතය (Title and content)
4) සිරස්තලය සහිත අන්තර්ගතය (Content with caption)

20. දත්ත සමුදාය හා සම්බන්ධ පහත දැක්වෙන කවර ප්‍රකාශය සත්‍ය වේද?
1) ප්‍රාථමික යතුර වගුවක ඇති දත්ත හඳුනා ගැනීමට භාවිතා වන අතර ආගන්තුක යතුර භාවිත වන්නේ වෙනත් වගුවකට ඈඳීමට ය.
2) ආගන්තුක යතුර උපලැකියානක් (a record) හඳුනා ගැනීමට භාවිතා වන අතර ප්‍රාථමික යතුර වගු අතර ඈඳුම් සාදයි.
3) ආගන්තුක යතුර ඈඳුනු වගුවක ඇති උපලැකියාන කුලකයක් හඳුනා ගන්නා අතර ප්‍රාථමික යතුර ප්‍රධාන වගුවේ උපලැකියානයක් හඳුනා ගනියි.
4) ආගන්තුක යතුර ප්‍රධාන වගුවේ ගබඩා කළ හැකි දත්ත පිළිබඳ පාලන ක්‍රියාත්මක කරයි.

21. දෛශික (Vector) සහ රේඛා ප්‍රංජ ආලේඛ (Raster) වැඩතල (Workspace) දෙකෙහිම ක්‍රියාකරන ග්‍රැෆික් නිර්මාණකරන මෘදුකාංග දෙකක් සඳහන් වරණය කුමක්ද?
   1) Adobe Illustrator සහ Corel Painter
   2) Affinity Designer සහ CorelDRAW
   3) Affinity Designer සහ Xara Designer PRO X
   4) Corel Painter සහ Xara Designer PRO X

22. පහත සඳහන් කුමක් ශ්‍රව්‍ය සංස්කරණයට (audio editing) අදාළ කාර්ය පමණක් ලබා දෙයි ද?
   1) කැපීම (cutting) සහ බොද කිරීම (blurring)
   2) මිශ්‍ර කිරීම (mixing) සහ වියැකීම (fading)
   3) වියැකීම (fading) සහ බොද කිරීම (blurring)
   4) මිශ්‍ර කිරීම (mixing) සහ වර්ණ ගැන්වීම (coloring)

23. පහත සඳහන් සම්ප්‍රේෂණ මාධ්‍ය අතුරින් කුමක් ඒවායේ දත්ත සම්ප්‍රේෂණ වේගයන්ගේ ආරෝහණ පටිපාටිය අනුව පෙළගස්වා ඇති ද?
   1) හතරවන පරම්පරාවේ ජංගම සන්නිවේදනය (4G), Wi-Fi , අනාවෘත ඇඹරි යුගල (UTP )
   2) අනාවෘත ඇඹරි යුගල (UTP), ප්‍රකාශ තන්තු (Optical Fibre ), Wi-Fi
   3) ක්ෂුද්‍ර තරංග (Microwave), අනාවෘත ඇඹරි යුගල (UTP), ප්‍රකාශ තන්තු (Optical Fibre)
   4) Wi-Fi, ක්ෂුද්‍ර තරංග (Microwave), හතරවන පරම්පරාවේ ජංගම සන්නිවේදනය (4G)

24. වෙබ් පිටුවකට පැමිණෙන අමුත්තන්ගේ ස්වාභාවික අක්ෂි චලනය F අකුරේ හෝ Z අකුරු රටාවේ හැඩය අනුගමනය කිරීමට නැඹුරු වේ. එබැවින් වෙබ් පිටු සැලසුම් කිරීමේදී F හැඩැති සහ Z හැඩැති වෙබ් පිටු පිරිසැලසුම් (layout) බහුලම භාවිතා වී ඇත.
   පහත සඳහන් කුමන ප්‍රකාශය F හැඩැති සහ Z හැඩැති පිරිසැලසුම් භාවිතය නිවැරදිව පැහැදිලි කරයි ද?
   1) F හැඩැති පිරිසැලසුම් බ්ලොග් සටහන් සහ සෙවුම් ප්‍රතිඵල වැනි පෙළ (text) බහුල පිටු සඳහා වඩාත් ඵලදායි වන අතර Z හැඩැති පිරිසැලසුම පතිතවීමේ (landing) පිටු සහ මුල් පිටු වැනි පෙළ අවම පිටු සඳහා යෝග්‍ය ය.
   2) Z හැඩැති පිරිසැලසුම් බ්ලොග් සටහන් සහ සෙවුම් ප්‍රතිඵල වැනි පෙළ බහුල පිටු සඳහා වඩාත් ඵලදායි වන අතර F හැඩති පිරිසැලසුම පතිතවීමේ පිටු සහ මුල් පිටු වැනි පෙළ අවම පිටු වැනි පෙළ අවම පිටු සඳහා යෝග්‍ය ය.
   3) F හැඩැති පිරිසැලසුම සහ Z හැඩැති පිරිසැලසුම යන දෙකම පෙළ බහුල හෝ පෙළ අවම වෙබ් පිටු සැලසුම් කිරීමේදී එකසේ ඵලදායි වේ.
   4) F හැඩැති හෝ Z හැඩැති පිරිසැලසුම තෝරාගැනීම සම්පූර්ණයෙන්ම නිර්මාණකරු මත රදා පවතින අතර පිටුවේ අන්තර්ගතයට අදාළ නොවේ.

25. HTML හි පටිපාටිගත ලැයිස්තු (Ordered Lists),
   1) ඒවායේ අයිතම ආකාරදි පිළිවෙලට නැවත සකස් කරයි.
   2) පෙරනිමියෙන් (default) ඔවුන්ගේ අයිතම අංක සමග පෙන්වයි.
   3) බුලට් (bullet) සමග අයිතම පෙන්වයි.
   4) බුලට් ලැයිස්තු ලෙස ද හැදින් වේ.

26. පහත සඳහන් ඒවායින් නිවැරදි කුමක්ද?
   1) HTML යනු ක්‍රමලේඛන භාෂාවකි.
   2) HTML වලට MySQL දත්ත සමුදායන් වෙත සෘජුවම ප්‍රවේශ විය හැකිය.
   3) HTML වෙබ් අඩවිවල මූලික තැනුම් කොටස් සපයයි.
   4) HTML ක්‍රියාත්මක කිරීමට පෙර බයිට් කේතයට සම්පාදනය කෙරේ.

27. පද්ධති විශ්ලේෂකයින්ගේ කාර්යභාරය පමණක් විස්තර කරන්නේ පහත සඳහන් කවරකින් ද?
   1) වත්මන් පද්ධති අධ්‍යයනය කිරීම, පද්ධති විශ්ලේෂණය කිරීම, පද්ධති අවශ්‍යතා නිර්වචනය කිරීම, පද්ධතිය සැලසුම් කිරීම, පද්ධතිය ඇගයීම සහ යාවත්කාලීන කිරීම.
   2) පරිශීලක අතුරුමුහුණත සැලසුම් කිරීම, කේතය ලිවීම සහ සමාලෝචනය කිරීම, වෙබ් අඩවියට බහුමාධ්‍ය අන්තර්ගතය ඒකාබද්ධ කිරීම, වෙබ් යෙදුම පරීක්ෂා කිරීම.
   3) පිරිසැලසුම සෑදීම, කලා කෘති සහ පෙළ පිරිසැලසුමකට ස්ථානගත කිරීම, චිත්‍රක සංස්කරණය කිරීම, මුද්‍රණය සඳහා ගොනු පරිවර්තනය කිරීම.
   4) සේවාදායකයින්ගේ අවශ්‍යතා ලබා ගැනීම, මෘදුකාංග වැඩසටහන් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම, පද්ධති පරීක්ෂා කිරීම සහ ඇගයීම, තත්ත්ව සහතික කිරීමේ ක්‍රියා පටිපාටි සංවර්ධනය කිරීම

28. පහත දක්වා ඇති පරිගණකයක සංරචක සලකා බලන්න.
   A - Intel Core i5 සකසනය
   B - 24” LCD තිරය
   C - 802.11 ac 2.4/5 GHz රැහැන් රහිත ජාල අනුවර්තකය (adapter)
   D - JeDEL සම්මත USB යතුරු පුවරුව K11 Black
   E – 40 GB ඝන අවස්ථා ධාවකය (SSD)

   පරිගණකයක්, පද්ධතියක් ලෙස සැලකීමට වඩාත් උපකාරී වන්නේ පහත දක්වා ඇති කුමන සංරචක සංයෝජනය ද?

   1) A, B, C සහ E පමණි
   2) A, B, D සහ E පමණි
   3) A, C, D සහ E පමණි
   4) B, C, D සහ E පමණි

29. පහත දැක්වෙන බූලියානු ප්‍රකාශනය A, B, C සහ D හා වගන්ති හතර සලකා බලන්න.
   බූලියානු ප්‍රකාශනය : X + (NOT) Y + Z
   A - (X=0, Y=1, Z=0)
   B - (X=1, Y=1, Z=0)
   C - (X=0, Y=1, Z=1)
   D - (X=0, Y=0, Z=0)

   පහත ඒවායින් ඉහත බූලියානු ප්‍රකාශනයෙහි අගය 0 ලෙස ලබා දෙන්නේ කුමක්ද?

   1) A පමණි
   2) D පමණි
   3) A සහ B පමණි
   4) A සහ C පමණි

30. පහත ප්‍රකාශ සලකා බලන්න.
   A - විධාන පේළි අතුරුමුහුණත් (CLI), චිත්‍රක පරිශීලක අතුරුමුහුණත් (GUI) වලට වඩා වේගවත් වේ.
   B - විධාන පේළි අතුරුමුහුණත් මගින් ප්‍රවේශ විය හැකි සියලුම විශේෂාංග වලට චිත්‍රක පරිශීලක අතුරුමුහුණත් මගින්ද ප්‍රවේශ විය හැකි ය.
   C - විධාන පේළි අතුරු මුහුණත භාවිතා වන ක්‍රමලේඛන භාෂාව කවච භාෂාවක් (Shell language) ලෙස හැඳින්වේ.

   විධාන පේළි අතුරු මුහුණතක් සඳහා වලංගු වන්නේ පහත සඳහන් කුමන ප්‍රකාශය ද?

   1) A සහ B පමණි
   2) A සහ C පමණි
   3) B සහ C පමණි
   4) A, B සහ C සියල්ලම ය

31. පහත ප්‍රකාශ සලකා බලන්න
   A - වදන් සැකසුම් (Word processing) මෘදුකාංගයක් භාවිතයෙන් ලිපි, ජීව දත්ත පත්‍ර සහ වාර්තා වැනි පෙළ ලේඛන සෑදිය හැකිය.
   B - MS word සහ Libre office writer යනු වදන් සැකසුම් මෘදුකාංග සඳහා උදාහරණ දෙකකි.
   C - සුහුරු ජංගම දුරකථනවල (Smartphones) වදන් සැකසුම් කළ නොහැකි ය.

   1) A සහ B පමණි
   2) A සහ C පමණි
   3) B සහ C පමණි
   4) A, B සහ C සියල්ලම

32. පහත ප්‍රකාශ සලකා බලන්න

A - සංස්ථාපිත ශබ්දකෝෂයට අදාල ව අක්ෂර වින්‍යාස වැරදි හදුනා ගැනේ.

B - ව්‍යාකරණමය දෝෂ හදුනා ගනු ලබන්නේ ව්‍යාකරණ නිසි ලෙස භාවිතා කිරීමේ නීති ලැයිස්තුවක් භාවිතා කරමිනි.

C - සංස්ථාපිත ශබ්දකෝෂයට නව වචන ඇතුළත් කළ හැකි ය.

වදන් සැකසුම් මෘදුකාංගයක ඇති අක්ෂර වින්‍යාස සහ ව්‍යාකරණ පරීක්ෂකයක් සම්බන්ධයෙන් නිවැරදි වන්නේ පහත සදහන් කුමක් ද?

1) A සහ B පමණි
2) A සහ C පමණි
3) B සහ C පමණි
4) A, B සහ C සියල්ලම ය

33. පැතුරුම්පත් මෘදුකාංගයක ඇති පහත ප්‍රස්තාර වර්ග සලකා බලන්න.

A – පොකුරු තීරු ප්‍රස්තාර (Clustered Column chart)

B – රේඛීය ප්‍රස්තාර (Line chart)

C – අට්ටිගැසු තීරු ප්‍රස්තාර (Stacked Column chart)

D – වට ප්‍රස්තාර (Pie chart)

භාණ්ඩයක විකුණුම්වල මුළු වටිනාකම සහ විවිධ පාරිභෝගික කොටස් විසින් මිලදී ගත් මුදල සංසන්දනය කිරීමේ අවශ්‍යතාවයක් ඇත. (උදාහරණයක් ලෙස A නම් නිමැවුමේ සම්පූර්ණ විකුණුම රු .650 ලෙස ගනිමු. මේ අතුරින් රු . 450 ක විකුණුම් වැඩි ආදායමක් සහිත පාරිභෝගිකයන් විසින් සහ ඉතිරි රු 200 විකුණුම් අඩු ආදායම සහිත පාරිභෝගිකයන් විසින් ද මිලදී ගන්නා ලදී.)

ඉහත කාර්යය සදහා වඩාත් සුදුසු වන්නේ පහත ප්‍රස්තාර වර්ග අතුරින් මොනවාද ?

1) A සහ B පමණි
2) A සහ C පමණි
3) A සහ D පමණි
4) A , B සහ C පමණි

34. පහත ප්‍රකාශ සලකා බලන්න

A - සජීවීකරණ සංයෝජනය (Animation combo) සහ අභිරුචි චලිතය (Custom motion) යනු අභිරුචි සජීවීකරණ නිර්මාණය කිරීමේ ක්‍රම දෙකකි.

B - සජීවීකරණ කවුළුව (Animation pane) හෝ අභිරුචි සජීවීකරණ මගින් PowerPoint කදාවේ ඇති සජීවීකරණ පිළිබද සම්පූර්ණ පාලනය ලබා දෙයි.

C - පෙළ, හැඩතල හෝ පින්තූර සදහා අභිරුචි සජීවීකරණ යෙදිය හැක.

D - සජීවීකරණ භාවිතා කිරීමේ මූලික සංකල්පය වන්නේ අන්තර්ගතය අන්තර්ක්‍රියා කිරීමයි.

අභිරුචි සජීවීකරණ සම්බන්ධයෙන් පහත සදහන් දේවලින් නිවැරදි කුමක්ද?

1) A, B සහ C පමණි
2) A, B සහ D පමණි
3) B, C සහ D පමණි
4) A, B, C සහ D යන සියල්ලම ය

35. පහත ප්‍රකාශ සලකා බලන්න

A - චිත්‍රකයේ වර්ණය, දිශානතිය, පිහිටීම සහ හැඩය වෙනස් කිරීම ග්‍රැෆික් සංස්කරණ ක්‍රියාවලියේ සමහර ක්‍රියාකාරකම් වේ.

B - දෛශික ග්‍රැෆික්ස් වල රූපය වැඩිදියුණු කිරීම සදහා රූප සංස්කාරකවරුන්ට පික්සල අගයන් වෙනස් කළ හැකිය.

C - ග්‍රැෆික් සංස්කරණ මෘදුකාංග, දෛශික ග්‍රැෆික් සංස්කාරක, රේඛා ප්‍රංජ ආලේඛ ග්‍රැෆික් සංස්කාරක සහ ත්‍රිමාණ ආකෘති නිර්මාණකරු ලෙස පුළුල්ව කාණ්ඩගත කර ඇත.

D - දෛශික ග්‍රැෆික්ස් කිසිදු විභේදනයක් (Resolution) නැති නොවී ප්‍රතිප්‍රමාණ කළ හැකිය.

ඩිජිටල් ග්‍රැෆික් සංස්කරණය සම්බන්ධයෙන් පහත සදහන් දේවල් වලින් නිවැරදි වන්නේ කුමක්ද ?

1) A, B සහ C පමණි
2) A, B සහ D පමණි
3) A, C සහ D පමණි
4) B, C සහ D සියල්ලම

36. පහත අයිතම සලකන්න:

A – අතථ්‍යරූපී (virtualized) පරිගණන සම්පත්

B – යෙදුම් සංවර්ධන මෙවලම්

C – අතථ්‍යරූපී දෘඩාංග

පහත සඳහන් ඒවායින් වලාකුළු පරිගණන (Cloud computing) සේවා පමණක් ලබා දෙන්නේ කුමක් ද?

1) A සහ B පමණි
2) A සහ C පමණි
3) B සහ C පමණි
4) A, B සහ C යන සියල්ලම ය

37. පහත ප්‍රකාශ සලකා බලන්න:

A – MP4 වීඩියෝවක් HTML ගොනුවකට ඇතුළත් කළ හැකිය.

B – MP3 ශ්‍රව්‍යයක් වෙබ් පිටුවකට ඇතුළත් කළ හැකිය.

C – YouTube වීඩියෝවක් වෙනත් වෙබ් පිටුවකට ඇතුළත් කළ හැකිය

වෙබ් පිටුවකට ශ්‍රව්‍ය හෝ වීඩියෝවක් හෝ ඇතුළත් කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් දේවලින් නිවැරදි කුමක් ද?

1) A සහ B පමණි
2) A සහ C පමණි
3) B සහ C පමණි
4) A, B සහ C යන සියල්ලම ය

38. සංවිධානයක පහත අවශ්‍යතා සලකා බලන්න:

A – සේවකයන්ට, සන්නිවේදනය සහ ඔවුන්ගේ කාර්යය ඉටු කිරීම් සඳහා ප්‍රමාණවත් දෘඪාංග සහ මෘදුකාංග මෙවලම් තිබිය යුතු ය.

B – සේවකයන්ගේ කාර්ය සාධනය තක්සේරු කිරීම සඳහා අවශ්‍ය ඵලදායි සන්නිවේදන මෙවලම් සඳහා ආයෝජනය කළ යුතුය.

C – අතථ්‍ය ආකාරයෙන් වැඩ කිරීමට සේවකයන් පුහුණු කළ යුතු ය.

D – ඩිජිටල් අනුවර්තනය පිළිබඳ සමාගම පුරා ප්‍රතිපත්තියක් තිබිය යුතු ය.

ආයතනයට නිවසේ සිට වැඩ කිරීමේ සංකල්පය සාර්ථකව අනුගමනය කිරීම් සඳහා පහත සඳහන් දේවලින් කුමක් අවශ්‍ය ද?

1) A සහ B පමණි
2) A සහ C පමණි
3) A, B සහ C පමණි
4) A, B, C සහ D යන සියල්ලම ය

39. මනීෂා පාසල් අධ්‍යාපනය අවසන් කර, ඇයගේම ව්‍යාපාරයක් ආරම්භ කළා ය. ඇය සිය ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම සඳහා සමාජ මාධ්‍ය ගිණුම් කිහිපයක් විවෘත කළා ය. කෙසේ වෙතත්, සමාජ මාධ්‍ය අවභාවිතය පිළිබඳ සමහර මාධ්‍ය පළ කිරීම් දැකීමෙන් පසු, ඇයට ඇයගේ සමාජ ජාල ගිණුම් සුරක්ෂිත කර ගන්නේ කෙසේද යන්න පිළිබඳව ඔබේ උපදෙස් අවශ්‍ය ය.

පහත ප්‍රකාශ සලකා බලන්න:

A – ශක්තිමත් මුරපද සැකසීම

B – ඔබේ සියලුම මුරපදවල මෘදු පිටපතක් ඔබේ පරිගණකයේ තබා ගැනීම

C – ඔබගේ ගිණුම දුරකථන අංකයක් සමග සම්බන්ධ කරගන්න

D – සැමකල්හිම ගිණුම හා පූරණය (Sign-in) වී සිටින්න

ඔබ මනීෂාට දෙන උපදෙස් පහත සඳහන් දේවලින් කුමක් ද?

1) A සහ C පමණක් තෝරාගන්න
2) C සහ D පමණක් තෝරාගන්න
3) A, B සහ C පමණක් තෝරාගන්න
4) B, C සහ D පමණක් තෝරාගන්න

ICTpastpaper.com

සියලුම හිමිකම් ඇවිරිණි / All Right Reserved

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
Department of Examinations, Sri Lanka

GIT | S | I, II

සාමාන්‍ය තොරතුරු තාක්ෂණ විභාගය, 2019, 2020, 2021, 2022(2023)
General Information Technology Examination, 2019, 2020, 2021, 2022(2023)

# සාමාන්‍ය තොරතුරු තාක්ෂණය I, II
# General Information Technology I, II

## සාමාන්‍ය තොරතුරු තාක්ෂණය II

ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න

1. ශාන් මහතා විද්‍යා ගුරුවරයෙකි. ඔහු අ.පො.ස උසස් පෙළ සිසුන්ට ජීව විද්‍යාව උගන්වන්නේ මිශ්‍ර ක්ෂුද්‍ර ඉගෙනුම් (Blended Micro Learning) ප්‍රවේශයක් භාවිතා කරමිනි. ඔහුගේ ඉගැන්වීම සඳහා, ඔහුගේම ඩිජිටල් අන්තර්ගතයන් (වීඩියෝ) නිර්මාණය කිරීමට ඔහුට අවශ්‍ය වේ. මේ සඳහා පරිගණකයක් සහ වීඩියෝ කැමරාවක් මිලදී ගැනීමට ඔහු අදහස් කරයි. නමුත් වීඩියෝ සංස්කරණය සඳහා සුදුසු ඩෙක්ස්ටොප් පරිගණකයක් සඳහා නිවැරදි පිරිවිතර ගැන ඔහුට අදහසක් නැත.

ශාන් මහතා තම මිතුරෙකුගෙන් ඉල්ලා සිටියේ ඔහුට ඩෙක්ස්ටොප් පරිගණකයක් මිලදී ගැනීමට උදව් කරන ලෙසයි. මිතුරා ඔහුට ඩෙක්ස්ටොප් පරිගණකයක් සඳහා පහත දක්වා ඇති පිරිවිතර තුනක් ලබා දී එකක් තෝරා ගන්නා ලෙස ඉල්ලා සිටියේ ය. දැන් ඔහුට ඩෙක්ස්ටොප් පරිගණකයක් සඳහා නිවැරදි පිරිවිතර තේරීමට ඔබේ සහාය අවශ්‍ය වී ඇත.

| | පිරිවිතර 01 | පිරිවිතර 02 | පිරිවිතර 03 |
|---|---|---|---|
| සකසනයේ මාදිලිය (Processor Model) | Intel Core i5 | Intel Core i3 | Intel Core i5 |
| සකසනයේ පරම්පරාව (Processor Generation) | 3rd Generation | 4th Generation | 3rd Generation |
| සසම්භාවී ප්‍රවේශ මතකය (RAM) | 4GB | 4GB | 8GB |
| මතක ප්‍රරූපය (Memory Type) | DDR3 | DDR3 | DDR3 |
| දෘඪ තැටි වර්ගය (Hard Disk Type) | HDD | HDD | HDD |
| දෘඪ තැටියේ ධාරිතාව (Hard Disk Capacity) | 500GB | 320GB | 500GB |
| ග්‍රාපික (Graphics) | Intel HD Graphics | Intel HD Graphics | Intel HD Graphics |
| මෙහෙයුම් පද්ධතිය (Operating System) | Windows 10 Pro 64Bit | Windows 10 Pro 64Bit | Windows 10 Pro 64Bit |
| තිරයේ ප්‍රමාණය (Screen Size) | Dell 20” LED Monitor | 19” Dell Monitor | Dell 22” LED Moniter |

i. වීඩියෝ සංස්කරණය සඳහා යෝග්‍ය ඩෙක්ස්ටොප් පරිගණකයක් සඳහා ඔබ සලකා බලන සාධක මොනවාද?

ii. ලබා දී ඇති පිරිවිතර තුනෙන් එකක් තෝරා ඔබේ පිළිතුර සාධාරණීකරණය කරන්න.

iii. සෑම පුරවැසියෙකුටම මූලික පරිගණක දෘඩාංග පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට දිරිගන්වන වචන 150කට නොඅඩු ලිපියක් පුවත්පතකට ලියන්න.

2. අතථ්‍ය තොරතුරු තාක්ෂණ විශ්වවිද්‍යාලය (VITU) උපාධි පිරිනමන ආයතනයකි. එය දැනට තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව (B.Sc. Hons (IT)) උපාධියක් පිරිනමයි. මෙම උපාධිය සඳහා පහත ඇතුලත් කිරීමේ නිර්ණායක ඔවුන්ගේ වෙබ් අඩවියේ නව සිසුන් කණ්ඩායමක් කැඳවීමේ දැන්වීමක පළ කර තිබුණි.

(i) අ.පො.ස (උ.පෙළ) භෞතික විද්‍යා විෂය ධාරාවෙන් එක් වරකදී සාමාර්ථ තුනක් ලබා තිබීම.

හෝ

(ii) (a) අ.පො.ස. (උ.පෙළ) වෙනත් ඕනෑම විෂය ධාරාවකින් එක් වරකදී සාමාර්ථ තුනක්

සහ

(b) ගණිතය සමග තොරතුරු තාක්ෂණය පිළිබඳ පිළිගත හැකි පදනම පාඨමාලාවක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම.

i. තාර්කික සම්බන්ධක තුනක් හඳුනාගෙන ඒවායේ ක්‍රියාකාරීත්වය පැහැදිලි කරන්න.

ii. ඉහත ඇතුලත් කිරීමේ නිර්ණායක සඳහා සත්‍යතා වගුවක් අඳින්න.

iii. ඉහත ඇතුලත් කිරීමේ නිර්ණායක නියෝජනය කිරීම සඳහා සත්‍යතා වගුවක යෝග්‍යතාවය සාකච්ඡා කරන්න.

3. කොළඹ සිට අනුරාධපුරය දක්වා දිවෙන ප්‍රධාන මාර්ගය අසල පදිංචිව සිටින තරුණ ගොවි මහතෙකු, එම මාර්ගයේම ගමන් කරන සංචාරකයන්ට තම එළවළු තමන් විසින්ම විකිණීමට තීරණය කර ඇත. මෙය සාර්ථක ව්‍යාපාරයක් කර ගැනීමට නම් අලෙවි කළ යුතු එළවළු වර්ග, ඒවායේ ප්‍රමාණය සහ මිල ගණන් පිළිබඳව සංචාරකයින් කල් තියා දැනුම් දීම අත්‍යවශ්‍ය බව ඔහු අවබෝධ කරගෙන ඇත. මේ වසරේ අ.පො.ස. උසස් පෙළට පෙනී සිටින තම දියණිය සමඟ ඔහු මෙම අදහස සාකච්ඡා කළේ ය. ඇය මේ සඳහා වෙබ් පාදක මෘදුකාංග යෙදුමක් නිර්දේශ කළා ය. කෙසේ වෙතත් HTML, JavaScript සහ MySQL වැනි මෙවලම් භාවිතයෙන් එවැනි වෙබ් පාදක පද්ධතියක් සංවර්ධනය කරන්නනේ කෙසේදැයි ඇයට අදහසක් නැත. එහෙත් ජංගම යෙදුම් ඇතුළු තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ භාවිතය පිළිබඳව ඇයට දැනුමක් ඇත.

i. වෙබ් කතෘ මෙවලමක් (web authoring tool) යනු කුමක් ද? පැහැදිලි කරන්න.
ii. මෙම කාර්යය සඳහා භාවිත කළ හැකි ඔබ දන්නා වෙබ් කතෘ මෙවලමක් යෝජනා කර එය භාවිතයෙන් ඔබට මෙම යෙදුම සංවර්ධනය කළ හැකි ආකාරය පැහැදිලි කරන්න.
iii. වෙබ් කර්තෘ මෙවලම්වල වාසි සාකච්ඡා කරන්න.

4. "ශ්‍රී ලංකාව වසරකට විද්‍යුත් අපද්‍රව්‍ය මෙට්‍රික් ටොන් 25000 ක් පමණ ජනනය කරන අතර, ඉන් මෙට්‍රික් ටොන් 5000 ක් 8000 ක් අතර ප්‍රමාණයක් ප්‍රතිචක්‍රීකරණය සඳහා වෙනත් රටවලට අපනයනය කරනු ලබන්නේ ශ්‍රී ලංකාව තුල ප්‍රතිචක්‍රීකරණ පහසුකම් නොමැති නිසා බව පරිසර අමාත්‍යාංශයේ, පරිසර දූෂණ පාලන හා රසායනික කළමනාකරණ අංශයේ සහකාර අධ්‍යක්ෂ සුජීව ප්‍රනාන්දු මහතා පවසයි."

(උපුටා ගැනීම: Daily news online, 14 ඔක්තෝම්බර් 2021)

   i. විද්‍යුත් අපද්‍රව්‍ය නිර්වචනය කර, විද්‍යුත් අපද්‍රව්‍ය සඳහා ප්‍රධාන වශයෙන් දායක වන්නේ මොනවාද දැයි සඳහන් කරන්න.

   ii. විද්‍යුත් අපද්‍රව්‍ය පරිසරයට ඇති කරන අහිතකර බලපෑම පැහැදිලි කරන්න.

   iii. 3R සංකල්පය [අඩු කිරීම (Reduce), නැවත භාවිත කිරීම (Reuse), ප්‍රතිචක්‍රීකරණය (Recycle)] භාවිතයෙන් ඔබට විද්‍යුත් අපද්‍රව්‍ය කළමනාකරණය කළ හැකි ආකාරය පැහැදිලි කරන්න.

5. Hewage Associates යනු විශාල ජාත්‍යන්තර සමාගම් සඳහා පහසුකම් සපයන මෘදුකාංග සංවර්ධන සමාගමකි. ඔවුන් පද්ධති සංවර්ධන පැවරුමක් භාර ගන්නා විට, ඔවුන් සේවාදායකයින්ගේ සංවිධානයේ විවිධ පුද්ගලයන් සමග අඛණ්ඩ සම්බන්ධතා පවත්වා ගත යුතුය. මෙම සම්බන්ධතා පුද්ගල-පුද්ගල ඇමතුම්, කුඩා කණ්ඩායම් රැස්වීම් මෙන්ම විශාල කණ්ඩායම් පුහුණුවීම් විය හැකිය. පද්ධති සංවර්ධනය කිරීමේ ක්‍රියාවලියේදී, සමාගම බොහෝ විද්‍යුත් ලේඛන සංවර්ධනය කරන අතර, ඒවා සාමාන්‍යයෙන් රහස්‍ය වේ. මෙම ලේඛන සේවාදායකයාට ආරක්ෂිත ආකාරයෙන් යැවිය යුතුය. ක්‍රියාත්මක කිරීමේ අදියරේදී පරිශීලක නාම සහ මුරපද වැනි සමහර රහස් තොරතුරු ද ආරක්ෂිත ආකාරයෙන් යැවිය යුතුය. Hewage Associates මෙම සියලු සන්නිවේදනයන් කිසිදු භෞතික සම්බන්ධතාවයකින් තොරව මාර්ගගතව සිදු කරයි.

   i. ඉහත සඳහන් කළ රැස්වීම පැවැත්වීම සඳහා සුදුසු මෙවලමක් යෝජනා කරන්න.
   ii. ඔබ යෝජනා කරන මෙවලමෙහි උපකාරක විශේෂාංග දක්වමින් ඔබේ පිළිතුර සාධාරණීකරණය කරන්න.

   iii. ඉලෙක්ට්‍රොනික ලේඛන ආරක්ෂිතව යවන විවිධ ක්‍රම සාකච්ඡා කරන්න.

   iv. පරිශීලක නාම සහ මුරපද වැනි තොරතුරු ආරක්ෂාකාරීව හා ඉක්මනින් යැවීමට ඔබට භාවිත කළ හැකි ක්‍රම මොනවාද?

6. ශ්‍රී ලංකා රජය, 2023 ජනවාරි 1 සිට නව පුද්ගලික ආදායම් බද්දක් ක්‍රියාත්මක කර ඇත. "වාර්ෂික බදු ගණනය කිරීම සඳහා ආදායම" මත පහත දී ඇති වගුවට අනුව ආදායම් බදු ප්‍රතිශත යොදාගනිමින් වාර්ෂික බදු ගණනය කිරීම සිදු කළ යුතුය.

| ආදායම් බදු ප්‍රතිශතය | |
|---|---|
| පළමු රුපියල් 500,000 සඳහා | 6% |
| ඊළග රුපියල් 500,000 සඳහා | 12% |
| ඊළග රුපියල් 500,000 සඳහා | 18% |
| ඊළග රුපියල් 500,000 සඳහා | 24% |
| ඊළග රුපියල් 500,000 සඳහා | 30% |
| ඉතිරිය සඳහා | 36% |

(මූලාශ්‍රය: INLAND REVENUE DEPARTMENT- Notice to Taxpayers, PN/IT/2022-03, 15.12.2022)

i. පැතුරුම්පත්වල ඇති සූත්‍රවල ප්‍රතිලාභ පැහැදිලි කරන්න.

ii. ලබා දී ඇති "මාසික බදු ගණනය කිරීම සඳහා ආදායම" මත මාසික ආදායම් බද්ද ගණනය කිරීමට පැතුරුම්පතක දළසටහනක් අඳින්න. එහි එක් එක් කෝෂයේ අන්තර්ගතය පැහැදිලි කරන්න.

iii. පැතුරුම්පතෙහි ඔබ යෙදූ හැඩසව් ගැන්වීම් විස්තර කරන්න.

7. ඔබ පදිංචි ස්ථානයට ආසන්න පාසලකින්, ඔවුන්ගේ "තොරතුරු තාක්ෂණ දිනය" සඳහා "මෙහෙයුම් පද්ධති" පිළිබඳ දේශනයක් පැවැත්වීමට ඔබට ආරාධනා කර ඇත. එම ප්‍රදේශයේ අනෙකුත් පාසල්වල සිසුන්ට ද මේ සඳහා සහභාගීවීමට ආරාධනා කිරීමට සංවිධායක මණ්ඩලය අපේක්ෂා කරයි. එබැවින් එදින සහභාගී වන සියලුම දෙනාට ලබාදීමට ආරාධිත දේශකයන්ගේ දේශන ඇතුලත් පොතක් සකස් කිරීමට ද සංවිධායක කමිටුව තීරණය කර ඇත. "මෙහෙයුම් පද්ධති" පිළිබඳ පිටු දෙකක ලේඛනයක් සකස් කරන ලෙස සංවිධායක මණ්ඩලය ඔබෙන් ඉල්ලා සිටී. පහත සඳහන් අයිතම තුන ඇතුලත් වන පරිදි ලේඛනය සකස් කරන්න.

i. පොදුවේ භාවිත වන මෙහෙයුම් පද්ධති තුනක් පාඨකයන්ට හඳුන්වා දිය යුතුය.

ii. පරිගණකයක් තුල සිදුවන්නේ කුමක් ද යන්න පාඨකයන්ට තේරුම් ගත හැකි අයුරින් නවීන මෙහෙයුම් පද්ධතියක කාර්යයන් පහක් හඳුන්වා දිය යුතුය.

iii. පරිගණකයක් ආරම්භ කිරීමේදී මෙහෙයුම් පද්ධතියක ආරම්භ කිරීමේ ක්‍රියාවලියක (booting process) කාර්යභාරය පැහැදිලිව ඉදිරිපත් කළ යුතුය.